# හිසකෙස් වර්ණක නිසා ඇතිවන ගැටලු

# (Problems Related to hair dye)

දැන් දැන් හිසකෙස් වර්ණ ගැන්වීම ඉතාමත් ප්‍රචලිත වී ඇත. මේ නිසා ඇතිවන ආසාත්මිකතා ද බහුලව වාර්තා වේ. මෙම තත්ත්වය hair dye contact dermatitis ලෙස හැඳින්වේ.

ආසාත්මිකතා වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ ස්ථාවර (Permanent) හා අර්ධ ස්ථාවර ( Semi - Permanent ) කේශ වර්ණක වර්ග වලිනි.

කේශ වර්ණකවල අඩංගු PPD (පැරා ෆෙනිලින් ඩයි ඒමයින්) නම් සංඝටකය බොහෝමයක් හිසකෙස් වර්ණ ගැන්වීමෙන් පසු ඇතිවන ආසාත්මිකතාවයන්ට හේතු වේ. මෙම සංඝටකය කළු හෝ කළු දුඹුරු වර්ණකයන් බොහොමයක අඩංගු වේ. ඒ හැර වෙනත් සංඝටකවලටද ආසාත්මිකතා ඇතිවිය හැක.
උදාඃ - ඇමෝනියා

## (1) වැඩිපුර මේ තත්ත්වය ඇතිවන්නේ කාටද?

- සමහර පුද්ගලයන්ට ආසාත්මිකතාවයන් ඇති වීමට වැඩි ප්‍රවණතාවයක් ඇත.
- එම නිසා එවැනි පුද්ගලයන්ට හිසකෙස් වර්ණකවල ඇති සංඝටකවලට චර්ම ප්‍රදාහ තත්ත්වයක් ඇතිවිය හැක.

## (2) එය ඇතිවන්නේ කෙසේද?

හිසකෙස් වර්ණකවලට ඇති වන චර්ම ප්‍රදාහ තත්වයන් ආකාර දෙකකට ඇතිවිය හැක.

- Irritant Contact Dermatitis - කෙළින්ම සමට හානි පමුණුවන ද්‍රව්‍ය නිසා ඇතිවන චර්ම ප්‍රදාහය
- Allergic Contact Dermatitis - ආසාත්මිකතාවය නිසා සමට වන හානිය තුලින් ඇතිවන චර්ම ප්‍රදාහය

## (3) කේශ වර්ණක සඳහා වන ආසාත්මිකතා හඳුනා ගන්නේ කෙසේද? (රෝග ලක්ෂණ)

- මද වශයෙන් ඇතිවන වෙනස්කම්වල සිට ඉතා භයානක ප්‍රථිඵල දක්වා රෝග ලක්ෂණ විවිධයි.

- සම රතුවීම, කැසීම, වියළීම, සමහර විට දියර බිබිලි ඇතිවීම හෝ දියර ගැලීම මද වශයෙන් ඇති වන වෙනස්කම්ය.

- මෙම තත්ත්වය හිසෙහි හෝ මුහුණෙහි පටන් ගෙන අනෙකුත් ස්ථානවලටද පැතිර යා හැකිය.

- මෙයට අමතරව හිස හා මුහුණ ඉදිමීම, ශාරීරික අපහසුව, කරප්පන් ඇඟ පුරා මතුවීම ද දැකිය හැකිය.

- තද බල ලෙස ආසාත්මිකතාවයන් ඇති වූ විට වර්ණක ආලේපනයෙන් මිනිත්තු කිහිපයකදී සමෙහි ඇතිවන වෙනස්කම් සමඟ මුහුණ ඉදිමීම, ඇස් ඉදිමීම, ක්ලාන්තය හුස්ම ගැනීමේ අපහසුව, ගිලීමට අපහසු වීම, බඩේ කැක්කුම, වමනය, සිහිවිකල් වීමද සිදුවිය හැක. නිසි ක්‍රියා මාර්ග ඉක්මනින් නොගතහොත් මරණය ද සිදුවිය හැක.

- ආසාත්මිකතාවයන් හා මෙම චර්ම ප්‍රදාහ තත්ත්ව වර්ණක පාවිච්චිය පටන්ගත් අවධියේම හෝ අවුරුදු 2-10 හෝ ඊට වැඩි කාලයකට පසුවද ඇතිවිය හැකිය.

## (4) මෙම තත්ත්වය වළක්වා ගන්නේ කෙසේද?

- හැකිතාක් දුරට හිස් කබලේ නොගෑවෙන ලෙස වර්ණක ගැල්වීම.
- නියමිත කාල සීමාවට වඩා වර්ණකය ගල්වා නොතැබීම
- අත්වැසුම් දමා ගැල්වීම
- වර්ණක ගැල්වීමෙන් පසු හිසකෙස් මනාව සේදීම

## (5) හිසකෙස් වර්ණක සඳහා ආසාත්මිකතාවක් ඇත්දැයි පරීක්ෂා කර ගන්නේ කෙසේද?

- සෑම විටම කේශ වර්ණක ගැල්වීමට ප්‍රථම කණ පිටුපස හෝ වැලමිට ඇතුළු පැත්තේ වර්ණක ස්වල්පයක් ගල්වා පැය භාගයක් හෝ පැකට්ටුවේ දක්වා ඇති කාල සීමාව තබා ඉන්පසුව ආලේපනය සෝදා හැරිය යුතුය. එම ස්ථානයේ සමේ ඇතිවන වෙනස්කම් හෝ ආසාත්මිකතා ලක්ෂණ පැය 48ක පමණ කාලයක් පුරා නිරීක්ෂණය කළ යුතුය. මෙය එකම වර්ණකය දිගින් දිගටම භාවිතා කලද භාවිතා කරන සෑම අවස්ථාවකදීම සිදු කල යුතුය.

- ආසාත්මිකතා පිළිබඳ සැකයක් ඇති අයට චර්ම රෝග සායනයන්හි පවත්වා ගෙන යන Patch test පරීක්ෂාව තුලින් මෙවැනි contact allergy තත්ත්වයන් ගෙන දෙන සංඝටක හඳුනා ගැනීම සිදු කල හැක. (නමුත් සමහර සංඝටක මෙහිදී පරීක්ෂාවට ලක් නොවීමට ඉඩ ඇත.) එමෙන්ම සමහර විට මෙම ආසාත්මිකතාවයන් ඇති වන්නේ කාලයක් තුල මෙම සංඝටක වලට නිරාවරණය වූ පසුවයි.

## (6) මෙම තත්ත්වය සඳහා ලබාගත හැකි ප්‍රතිකාර මොනවාද?

- මද වශයෙන් ඇති වන තත්ත්වයන් සඳහා ඉක්මනින් හිසකෙස් සහ හිස් කබල සෝදා සුදුසුකම් සහිත වෛද්‍යවරයෙක් වෙත වහාම යොමු වන්න.

- එවිට ඔබේ වෛද්‍යවරයා ආලේපන සහ පෙති වර්ග ප්‍රතිකාර ලෙස ලබා දිය හැක.

- ආසාත්මිකතාවය හොඳින් සමනය වී සම යථා තත්ත්වයට පත්වූ පසු PPD රහිත කේශ වර්ණකයක් Patch test පරීක්ෂාවෙන් පසු භාවිතා කරන්න.

- තද බල ලෙස ඇතිවන තත්ත්වයකදී වහාම හදිසි ප්‍රතිකාර ඒකකයක් සඳහා යොමු විය යුතුය.